# කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය

( ජේ. ජයතිලක - කෘ.නි. )

කෘෂි රසායනික ද්‍රව්‍ය බොහෝය. බෝග නිෂ්පාදනයේ දී භාවිතා කරන කෘෂි රසායනික ද්‍රව්‍ය සමහරක් නම්:-

- කෘමිනාශක
- බැක්ටීරියානු නාශක
- දිලීර නාශක
- වල් නාශක
- අන්තර් පර්වයන් කෙටි කිරීම හෝ දික් කිරීම සඳහා භාවිතා කරන රසායනික
- මුල් ඇද්දවීමට ගන්නා හෝර්මෝන
- වැඩිපුර ඇති මල් එල හෝ කොළ වගේ අස්කිරීමට ගන්නා රසායනික
- ඇට නොමැති එල නිෂ්පාදනය සඳහා යොදන රසායනික (හෝර්මෝන)
- ලිංගික හෝර්මෝන
- දියර පොහොර
- ජුවනයිල් හෝමෝන

බොහෝ කෘමිනාශක පැට්‍රෝලියම් මූලිකව සාදා ඇති අතර, සමහරක් කෘතිම නිෂ්පාදනය හා අනිකුත් වර්ග පැලෑටි-යුෂ නොයෙකුත් ලුනු වගේ සමඟ මිශ්‍රකර සාදා ඇත. වැඩි වශයෙන්ම ගොවීන් පාවිච්චි කරනු ලබන්නේ කෘමිනාශක, දිලීරනාශක සහ වල්

නාශක වශයෙනි. මේවා කුඩු, සාන්ද්‍ර තෙලෝද, එරෝසෝල්ස් කැට හා ධූම වශයෙන් වෙළඳ පොළේ ඇත. සියළුම කෘමි නාශක විෂ සහිතය. විෂ තත්වය නිෂ්පාදනයට ගස් වගී අනුව වෙනස් වේ. කෘමිනාශක භාවිතයේදී එය ඉසින්නා විසින් විශේෂ ප්‍රවේශමෙනින් කටයුතු කළ යුත්තේ ඔහුට විෂවීම පමණක් නොව තමා වසන පරිසරය විෂවීම ගැනත් සැලකිය යුතු නිසාය.

ප්‍රථමයෙන්ම කෘමිනාශකයක් ක්ෂේත්‍රයේ ඉසිය යුතුද යන්න තීරණය කළයුතුය. මේ සඳහා කොතරම් දුරට කෘමියා හානිකර ඇත්ද කොතරම් දුරට ස්භාවිකව (වෙනත් කෘමීන් මගින්) මෙම කෘමියා මර්දනය වී ඇද්ද යන්න පිරික්සිය යුතුය. මෙම ස්භාවික මර්දනයේ තත්වය විකෘති වුවහොත් කෘමි උවදුර ඉතා සීඝ්‍රයෙන් පැතිරේ. එවැනි අවස්ථා වලදී කෘමිනාශක යෙදීම නිර්දේශ කරන නිර්දේශිත වර්ගය, ප්‍රමාණය, යොදන කාලය, පැලෑටියේ වර්ධනය සහ කෘමියාගේ දුර්වල අවස්ථාව ආදී කරුණු පිළිබඳව සලකා බැලිය යුතුය.

**කෘමි නාශක යෙදීමට පටන් ගැනීමට පෙර:-**

X කඳ සුළඟ වැඩි හෝ අධික හිරු රශ්මිය පිළිබඳව පරීක්ෂාකාරී වන්න.

X අවශ්‍ය ප්‍රමාණයට පිරිසිදු ජලය, සේදීමට සබන් (ආම්පන්න සහ ඇඟ සේදීමට) උදව් කරුවෙකු ක්ෂේත්‍රයේදී හදිසියක් වුවහොත් උදව්වීමට.

X නිර්දේශිත කෘමි නාශකය පමණක් ගන්න.

X කෘමි නාශකයේ (බෝතලයේ හෝ පැකට්ටුවේ) ඇති නිෂ්පාදනයින් ගේ උපදෙස් කියවා තේරුම් ගන්න.

X ප්‍රවේශමෙන් ක්ෂේත්‍රයට කෘමිනාශකය රැගෙන යන්න.

මුඩිය බුරුල් බෝතල් හෝ තැඩුනු පැකට්ටු ආදිය ගැන සැලකිලිමත් වන්න. කිසිවිටක ළමයින් ලවා කෘමිනාශක ඒගෙන යාම නොකළ යුතුය.

- X ආරක්ෂිත ඇඳුම්
- X ග්ලව්ස්, ගොගල්ස් (කන්නාඩි, මුහුණු වැස්ම (මාස්ක්) බෙල්ල සහ කන් ආවරණ, මේවා බෙහෙත් ඉසින්නා විසින් නිසි අයුරු පැළඳගත යුතුය.
- X බෙහෙත් ඉසීමට පෙර පිරිසිදු ජලය යොදා ස්ප්‍රේ යන්ත්‍රය ක්‍රියාකර බලන්න. කාන්දුවීම් තිබේ නම් හෝ නිසි අයුරු සකස් කිරීම වැනි දේවල් කිරීම මෙම අවස්ථාවේදී කළයුතුය.
- X තමාගේ ස්ප්‍රේයරයක් නොවේනම් ගණනය කර නොමැති නම් ගණනය කරන්න (කැලිබ්රේට්)
- X සියළු කොටස් නිසි අයුරු ක්‍රියා කරනවාද බලන්න. උපකරණය තවන්ට ක්‍රියාකරවිය හැකිද යන්න බලන්න.
- X පිරිසිදු ජලය, පනිට්ටුව, මිනුම් භාජනය සහ තැලීමට ලීයක් (අතින් කිසිවිටකත් කෘමිනාශක තැලිය යුතු නොවේ)
- X උදව් කරු.

## කෘෂිරසායන පාවිච්චි කරන විට

කෘමිනාශක ඉසීමේදී විශේෂයෙන්ම කෘමි නාශක අනිකුත් ද්‍රව්‍ය

සමග ස්පර්ශ වීම වැළැක්වෙන සේ ඉසීම කළ යුතුය. තවදුරටත් කියතහොත්,

- X අස්වනු නෙලීමට ආසන්න එලවලු හා පලතුරු
- X කෑම වර්ග සහ ජලය
- X ක්ෂෙත්‍රයට කිට්ටුව සිටින අය පිළිබඳව විමසිලිමත් වන්න. විශේෂයෙන්ම ළමුන්.
- X සුරතලුන් හා අවට තණ උලාකන ගවයින් හා කෑමගන්නා අනිකුත් සතුන්.
- X ළමුන් සෙල්ලම් කරන ස්ථාන
- X කෘමිනාශක කෙලින්ම දියපාරවල්, නාන ලිං සහ බොන ලිං වලට සේදීම නොකරන්න.
- X සුළඟට විරුද්ධ අතට සිට ස්ප්‍රේ නොකළ යුතුය.
- X අත්වල හා සමේ කෘමිනාශක ගෑවීමට ඉඩ නොතබන්න.
- X නොසලය හෝ විසිරෙන ස්ථානයේ රොඩු හිරවූවිට කටින් පිඹීම නොකරන්න.
- X බෙහෙත් ඉසීම හමාරකර අතපය හොඳින් සෝදන්නට පෙර දුම්බීම, ජලය පානය, කෑම හෝ බුලත් සැපීම නොකරන්න.
- X ස්ප්‍රේ යන්ත්‍රයේ ඉතිරි කෘමිනාශක තිබෙන්නට ඉඩ නොහරින්න. (වෙන අයෙක් අප්‍රවේශමෙන් එය පාවිච්චි කිරීමට ඉඩ ඇති නිසා)
- X නිර්දේශිත කෘමි නාශකය නිර්දේශිත ප්‍රමාණය පමණක් ඉසින්න.

## කෘමි නාශකය පාවිච්චි කළාට පසු

X ස්ප්‍රේ යන්ත්‍රය, අනිකුත් ආම්පන්න, සහ භාජන හොඳින් සේදීමට පසු ආරක්ෂක ඇඳුම් ගලවන්න.

X එම රෙදි හොඳින් සබන් ගා තිපවරක් පිරිසිදු ජලයෙන් සෝදන්න.

X සේදීමට තිබෙන අනිකුත් රෙදි සමඟ කෘමිනාශක ගැල්වුන රෙදි ගොඩ ගසා නොතබන්න.

X සබන් ගා පිරිසිදුජලයෙන් හොඳින් ඇඟපත සෝදාගන්න.

X කෘමිනාශක ස්පර්ශවූ රෙදි අන් අයෙකුට අතපත ගෑමට ඉඩ නොතබන්න. (හදිසි අවශ්‍යතාවයකදී හැර) විශේෂ යෙන් කුඩා ළමුන්.

X සේදීම හා පිරිසිදු කිරීමට ගත් ජලය වලක් කපා වලට දමා වසා දමන්න.

X බීමට හා නෑමට ජලය ගන්නා දිය පාරවල් වලට මෙම කෘමිනාශක ගැල්වූ රෙදි නො සෝදන්න.

X කෘමිනාශක බහාලූ භාජන, පැකට්ටු දවටන ආදිය ක්ෂෙත්‍රයේ දමා නොයන්න. ඒවා ළමුන් හෝ වෙන අය අහුලා ගෙන පාවිච්චියට ගතහැකි බැවින් සියල්ල වහා විනාශ කරන්න.

X ස්ප්‍රේ කරන ලද ස්ථානයට හෝ ක්ෂෙත්‍රයට අන් අයට ඇතුල්වීමට ඉඩ නොදෙන්න (නිෂ්පාදකයින් ගේ උපදෙස් අනුව නියමිත කාලසීමාව ගෙවෙන තුරු)